# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,941 - 2015 නොවැම්බර් මස 13 වැනි සිකුරාදා - 2015.11.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | 990 |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බුද්ල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | 1038 |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.* - විසර්ජන (සංශෝධන) පනත් කෙටුම්පත 2015 ඔක්තෝබර් මස 23 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2015 දෙසැම්බර් මස 04 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2015 නොවැම්බර් මස 20 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2015 ජනවාරි මස 22 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*


1111 - B 81001— 352 (2015/11)
D 1 -

# පිස්කල් විකිණීම් පිළිබඳ දැන්වීම්

## ගම්පහ දිසා අධිකරණයේ දී ය

මහනුවර දිසා අධිකරණ නඩු අංකය : DMR 00884/13

පිස්කල් අංකය : 24/2015.

මහනුවර, කටුගස්තොට පාර, අංක 187 හි ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යන කලින් ඉන්ද්‍රා ෆිනෑන්ස් සමාගම ලෙසත් නම් වෙනස් කිරීමෙන් පසුව දැනට සෙරන්ඩිබ් ෆිනෑන්ස් ලිමිටඩ්.

..........................පැමිණිලිකාර සමාගම.

*එදිරිව*

01. ගුරුසිංහ ආරච්චිගේ පද්මා ශ්‍රියංගනී මංගලිකා, අංක 142/8, ලක්මි පාර, ගම්පහ.

02. විදාන පතිරණගේ දෙන් චින්තක චන්ද්‍රකාන්ත, අංක 644/ඒ, තුඩුවේ ගෙදර, රාගම.

03. යාපා මුදියන්සේලාගේ මෙත්සිරි වසන්ත කුමාර, අංක 65/12, නුගගහවත්ත, උහන.

......................................... විත්තිකරුවන්.

ඉහත අංක දරන නඩුවේ 2013.10.30 වැනි දින දෙන ලද තීන්දුව ප්‍රකාර එකී නඩුවේ 01 වන විත්තිකාරියගෙන් අයවිමට ඇති රුපියල් 56,46,258.00 ක මුදලින් (එකී මුදලින් වාහනය විකුණා අයකරගත් මුදල සහ 01 වන විත්තිකාරිය විසින් ගෙවා ඇති මුදල් අඩුකළ යුතු යි.) ඉතිරි මුදල ද එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් ඒ මත නෛතික පොළිය ද, නඩු ගාස්තු ද, ඇස්කීසි ගාස්තු ද සහ පිස්කල් ගාස්තු ද අයකර ගැනීම සඳහා වර්ෂ 2015ක් වූ සැප්තැම්බර් මස 01 වැනි දින මා විසින් තහනමට ගන්නා ලද එකී නඩුවේ 01 වැනි විත්තිකාරියට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් දේපලෙහි ඇයට අයත් සියළුම අයිතිවාසිකම් හා හිමිකම් වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින ප. ව. 2.30 ට එකී දේපල පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, පිහිටි දෙල්ගහවත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. බී. එල්. ප්‍රනාන්දු මැන සාදන ලද අංක 3107 සහ 1999 ක් වූ මැයි මස 03 වැනි දිනැති සැලැස්මේ ප්‍රකාර ලොට් 02 දරණ ඉඩම වන උතුරට : අඩි පාර ද, නැගෙනහිරට : ලොට් 05 ද, දකුණට : ලොට් 05 ද, බස්නාහිරට : ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහයි දශම නවයයි තුන (අ.0, රූ. 0, පර්. 05.93) ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි සියලු දේ ද වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ බී 500/177 හි ලියාපදිංචි වී ඇත.

ඒ. එච්. අදිකාරි,
රෙජිස්ට්‍රාර්,
දිසා අධිකරණය,
ගම්පහ.

2015 ඔක්තෝබර් මස 02 වැනි දින.

11-239

## කොළඹ දිසා අධිකරණයේ දී ය

කොළඹ දිසා අධිකරණ නඩු අංකය : DMB 62-2009

මීගමුව දිසා අධිකරණ ඇස්කීසි අංකය : 45/2013.

කොළඹ 2, හයිඩ්පාක් කෝනර්, අංක 97, පෙර කොළඹ 1, ජනාධිපති මාවතේ, අංක 69, සෙලින්කෝ මන්දිරයේ, 3 වන මහලේ පිහිටි සීමාසහිත ද ෆිනෑන්ස් සමාගම, ද ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්.

......................................... පැමිණිලිකරු.

*එදිරිව*

01. ජාඇල, ඒකල, රජමාවත, ගලේවත්ත උතුර, අංක 14/100 හි පදිංචි දෝන දිශාන්ති ප්‍රියංගිකා මාතසිංහ.

02. ජාඇල, ඒකල, රජමාවත, ගලේවත්ත උතුර, අංක 14/100 හි පදිංචි ගුණසිංහ සජීව ද සිල්වා.

......................................... විත්තිකරුවන්.

ඉහත අංක දරන නඩු වාර්තාවේ ඇතුළත් කර ඇති වර්ෂ 2010.06.08 දිනැති තීන්දු ප්‍රකාශය මගින් ඉහත විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට රුපියල් හයලක්ෂ අනූහත්දහස් පන්සිය විසිහතරක (රු. 6,97,524.00) මුදලක් වර්ෂ 2008.11.12 වැනි දින සිට තීන්දු ප්‍රකාශයේ දිනය දක්වා මසකට 4%ක් බැගින් වැඩිදුර පොලිය ද, ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සඳහන් මුළු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් මසකට 4%ක් බැගින් එකී තීන්දු ප්‍රකාශයේ සඳහන් මුදල සහ වැඩිදුර පොලිය ද, නඩු ගාස්තු ද ඒ සඳහා තවදුරටත් පොලිය හා ගාස්තු අයකර ගැනීමට ආඥා කොට ඇති බැවින් ද,

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කේ. පතිරාජ විසින් සහතික කළ වර්ෂ 2005.08.18 දිනැති අංක 6640 දරන බැඳුම්කරය පදනම් කරගෙන ඉහත කී රු. 6,97,524.00 ක මුදල හා වැඩිදුර පොලිය ද, නඩු ගාස්තු ද අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති දේපල එකී ඉහත විස්තර කර ඇති දේපලට අයත් සියලුම අයිතිවාසිකම් පරවශතා සහ අනුබද්ධිතයින් ද, විත්තිකරුවන්ගෙන් කවර ආකාරයන් හෝ සියලු අයිතිවාසිකම් හිමිකම් බලපුලුවන්කාරකම් හිමිකම්පෑම් සහ ඉල්ලීම් ද මෙහි උපලේඛනයේ හා පැමිණිල්ලේ උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙන් උපදන සහ එකතුවන සියලු කුලී ලාභ සහ අනිකුත් ආදායම් ද සියලු ගිවිසුම් සහ රක්ෂණ ගිවිසුම් ද ඇතුළුව මෙහි උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති එකී දේපල නිශ්චිතවම බැඳී ඇති බව හා ඇස්කීසි කළහැකි බව ප්‍රකාශ කරන ලද හෙයින් ද, අධිකරණයෙන් නියම කරන ලද කොන්දේසිවලට යටත් ව පහත උපලේඛනයෙහි විස්තර කර ඇති දේපළ වර්ෂ 2015ක් වූ දෙසැම්බර් මස 17 වැනි දින පෙ. ව. 11.00 ට ඉඩමේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

එකී වෙන්දේසියේ දී ඉහලම ලංසු තබන්නා ගැනුම්කරු වන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැනුම්කරු විසින් මුළු ගැනුම් මිලෙන් 25% මුදලක් ද, පිස්කල් ගාස්තු ද රජයට අයවිය යුතු ගාස්තු, (පවුන්ඩ්ජ් ගාස්තු) තක්සේරු ගාස්තු, වෙන්දේසි ගාස්තු, ගැසට් පත්‍රයේ ගාස්තු සහ පුවත්පත්වල ප්‍රසිද්ධ කිරීමේ වියදම් ද, අනෙකුත් ප්‍රචාරක කටයුතු සඳහා වූ වියදම් ද එවලේම මුදලින් මා වෙත ගෙවිය යුතු ය. චෙක්පත් බාරගනු නොලැබේ. ගැනුම් මිලෙන් 75% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත කොළඹ දිසා අධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතු ය.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරලේ, රාගම් පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ, රද්දොලුව ග්‍රාමයේ පිහිටි දෙල්ගහවත්ත නැමති ඉඩමට (හා එහි පිහිටි දේපලට) වර්ෂ 2004.09.29 වැනි දින බලයලත් මානක ආර්. යූ. විජේතුංග විසින් බෙදා වෙන්කර මැන සාදන ලද අංක 3909ඒ/2004 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 1 දරන ඉඩමට මායිම්, උතුරට : බණ්ඩාර නමැත්තා විසින් හිමිකම් පාන ඉඩම හා පාර ද, නැගෙනහිරට : කේ. රොබට් ප්‍රනාන්දු හිමිකම් පාන ඉඩම ද, දකුණට : වර්ෂ 1987ක් වූ මැයි 21 වැනි දින බලයලත් මානක කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් සකස් කරන ලද අංක 738 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 02 හි කොටසක් ද, බස්නාහිරට : පාර ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහ අටක් (අ. 0, රූ. 0, පර්. 18) හෝ හෙක්ටයාර් 0.04554 විශාල ඉඩම සහ එහි පිහිටි දේපල ද සහ එයට අදාල සියලුම මාර්ග අයිතීන් ද සමග වේ. මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක B 189/26 යටතේ ලියාපදිංචි කර ඇත.

ආර්. ඩී. ගාමිණී,
රෙජිස්ට්‍රාර් පිස්කල්,
දිසා අධිකරණය,
මීගමුව.

2015 ඔක්තෝබර් මස 13 වැනි දින,
මීගමුව දිසා අධිකරණයේ දී ය.

11-290

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.